# 8 ශ්‍රේණිය සිංහල

## 06 ඒකකය - 2022

# කතා බහට අවධානය



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

08 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍රයක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 06. කතා බහට අවධානය

සවන් දීම දැනුම ලබා ගන්නා එක් මාර්ගයකි. නිවේදනයකට හෝ පණිවිඩයකට හෝ ප්‍රතිචාර දැක්විය යුත්තේ ද අවධානයෙන් යුතුව සවන් දීමෙනි. එකිනෙකා අතර ඇති වන කතා බහේ දී හා සංවාදවල දී අවධානය මෙන් ම ආචාරශීලි වීම ද අවශ්‍ය ය. එදිනෙදා ජීවිතයේ දී අපට විවිධ අය සමග කතා බහ කරන්නට සිදු වේ.



- ✓ ගිහි - පැවිදි
- ✓ ගුරු - ශිෂ්‍ය
- ✓ මවුපිය - දූදරු
- ✓ ප්‍රභූ - සාමාන්‍ය
- ✓ අප හා සම වයසේ අය
- ✓ වැඩිහිටියන්
- ✓ පූජ්‍ය - පූජක පක්ෂය
- ✓ විවිධ ආයතනවල නිලධාරීන්

මේ අය සමග කතා බහ කිරීමේ දී ඔවුන්ගේ වැඩිහිටිබවට, පූජනීයත්වයට, තනතුරට අදාළ වන සේ ආමන්ත්‍රණය හා ප්‍රතිචාර දැක්වීම කළ යුතු වෙයි. එයින් ආචාරශීලිභාවය පළ කරන්නා සේ ම සුහද සමාජ හා පුද්ගල සම්බන්ධතා ද වර්ධනය වෙයි.

සමාජය

- ගිහි සමාජය
  - මවුපිය - දූදරු (ඥාති)
  - වැඩිහිටි - බාල
  - ප්‍රභූන් විවිධ තරාතිරම් (තනතුරු)
- පැවිදි සමාජය

- **පැවිදි සමාජය - බෞද්ධ**



  - ✓ ස්වාමීන් වහන්සේ
  - ✓ ඔබ වහන්සේ
  - ✓ තෙරණින් වහන්සේ
  - ✓ මෑණියෝ/මෑණියන්වහන්සේ
  - ✓ වඩිනවා/ වළඳනවා/ සැතපෙනවා
  - ✓ අවසරයි

- පැවිදි සමාජය - කතෝලික
    - ✓ කාදිනල්තුමා
    - ✓ අගරදගුරුතුමා
    - ✓ රදගුරුතුමා
    - ✓ පියාණනි
    - ✓ සහෝදරතුමිය/කන්‍යාසොයුරිය



- පැවිදි සමාජය - ක්‍රිස්තියානි
    - ✓ දේවගැතිතුමා
- පැවිදි සමාජය - හින්දු
    - ✓ කුරුක්කල්තුමා
- පැවිදි සමාජය - මුස්ලිම්
    - ✓ මවුලවිතුමා



- පූජ්‍යත්වය හා ගරුත්වය
    - ✓ ගෞරවාර්හ
    - ✓ අති පූජ්‍ය
    - ✓ අතිගරු/ ගරු
- ඥාති සම්බන්ධතා
    - ✓ අම්මා/ තාත්තා
    - ✓ මාමා/ නැන්දා
    - ✓ අයියා/ අක්කා
    - ✓ දුව/ පුතා



- ප්‍රභූ සම්බන්ධතා
    - ✓ මහතා
    - ✓ මහත්මයා/මහත්තයා
    - ✓ නෝන මහත්තයා/නෝන මහත්මිය
    - ✓ මැතිතුමා/මැතිතුමිය
    - ✓ ඔබතුමා /ඔබතුමිය/තමුන්නාන්සේ
    - ✓ එතුමා/මෙතුමා

- තනතුරු අනුව
  - ✓ සභාපතිතුමා/තුමිය ඉංජිනේරුතුමා /තුමිය
  - ✓ ලේකම්තුමා/තුමිය ගුරුතුමා/තුමිය
  - ✓ අධ්‍යක්ෂතුමා/තුමිය ග්‍රාම නිලධාරි මහතා/මහත්මිය
  - ✓ ගණකාධිකාරිතුමා/තුමිය සෞඛ්‍ය පරීක්ෂකතුමා/තුමිය
  - ✓ වෛද්‍යතුමා/තුමිය පොලිස් ස්ථානාධිපතිතුමා/තුමිය

➢ සංවාදය 01 - ගැමි සිසු දරුවකු හා ගුරුවරයකු අතර සංවාදය (මීටර් සියය - ඒ. එච්. පියසේන)
  - ✓ ගැමි සිසු දරුවා - මුදලිහාමි
  - ✓ ගුරුවරයා - මහත්තයා

➢ සංවාදය 02 - රජයේ නිලධාරියකු හා ගැමි මවක අතර සංවාදය (පෙත්සම - ලීල් ගුණසේකර)
  - ✓ අම්මා
  - ✓ ඒජන්ත උන්නාන්සේ (ඒජන්තවරයා) වර්තමාන ව්‍යවහාරය අනුව දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා)

➢ සංවාදය 03 - ක්‍රීඩා සමාජයේ ලේකම්වරයා හා ප්‍රාදේශීය ලේකම් වරයා අතර සංවාදය
  - ✓ ක්‍රීඩා සමාජයේ ලේකම්වරයා (දසුන් ශානක)
  - ✓ ප්‍රාදේශිය ලේකම් තුමා (වැලිගලතැන්න)

- එකිනෙකා අතර ඇති වන කතා බහේ දී හා සංවාදවල දී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.
  - ✓ පුද්ගල විවිධත්වය ගැන සැලකිලිමත් වෙමින් කතා කිරීම.
  - ✓ ආචාරශීලී ව කතා කිරීම හා සවන් දීම.
  - ✓ සමාජ සම්බන්ධතා ගොඩ නගා ගැනීම.
  - ✓ කතා බහ කිරීමේ දී ඔවුන්ගේ වැඩිහිටිබවට, පූජනීයත්වයට, තනතුරට අදාළ වන සේ ආමන්ත්‍රණය හා ප්‍රතිචාර දැක්වීම.
  - ✓ ආවේගාත්මක නො වීම.
  - ✓ අනවශ්‍ය තොරතුරුවලින් තොරව අවශ්‍ය කරුණු දැක්වීම.
  - ✓ ප්‍රියශීලීභාවය, සංයමය සහ ආචාර සම්පන්නව හැසිරීම.
  - ✓ අවස්ථාව පැමිණි විට ප්‍රතිචාර දැක්වීම.

- සාමාන්‍ය කතා බහ පමණක් නො ව සවන් දීම මගින් දැනුම අධ්‍යාපනය ලබා ගැනීම ද සිදු වෙයි. ලිවීම ප්‍රචලිත නොවූ පැරණි සමාජයේ අධ්‍යාපනය මුළුමනින් ම සවන් දීම මත රඳා පැවතිණි. එදා උගතා හැඳින්වීම සඳහා යෙදුණු **'බහුශ්‍රැත'** යන්නෙහි අරුත ද **'බොහෝ ඇසූ'** යන්න යි. අද ද උගතකු හැඳින්වීමට 'බොහෝ ඇසූ පිරූ තැන් ඇති' යනුවෙන් ව්‍යවහාර කෙරේ.

### ලිඛිත අභ්‍යාස

1. පහත දැක්වෙන අවස්ථා අලළා සංවාදයක් ගොඩනගන්න.

   i. ඔබේ පන්ති කාමරයේ පැවැත්වෙන චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට විදුහල්පතිතුමාට පැමිණෙන ලෙස ආරාධනා කරන අවස්ථාව

   ii. ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීමේ දී බැංකු නිලධාරියකු සමග කතා බහ කරන අවස්ථාව

   iii. ඔබේ පාසලේ අධ්‍යාපන චාරිකාවක් සඳහා බස් රථයක් ලබා ගැනීම සඳහා ව්‍යාපාරික මහතකු සමග කරන කතා බහ

- **ලිඛිත අභ්‍යාස**

1. ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීමේ දී බැංකු නිලධාරියකු සමග කතා බහ කරන අවස්ථාව

| | |
|---|---|
| බැංකු නිලධාරියා: | එන්න වාඩිවෙන්න |
| දසුන් : | සුබ උදෑසනක් වේවා!<br>(බැංකු නිලධාරියා ද ආශීර්වාද කරයි.)<br>මට ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කරන්න ඕනෑ. |
| බැංකු නිලධාරියා: | ඔබ තුමාට මම ඉල්ලුම් පත්‍රයක් දෙන්නම්. ඒක පුරවලා විස්තර භාර දෙන්න. මම ගිණුමක් විවෘත කරලා දෙන්නම්. |
| දසුන් : | හොඳයි. මම පුරවලා දෙන්නම්. මුලින්ම මුදල් කීයක් තැන්පත් කරන්න ඕනි ද? |
| බැංකු නිලධාරියා: | එහෙම ගණනක් නැහැ. ඔබ තුමාට කැමති ගණනක් තැන්පත් කරන්න පුළුවන්. මේකෙ විස්තර තියෙනවා.<br>(අත් පත්‍රිකාවක් ලබා දෙයි) |
| දසුන්: | ඔබතුමාට බොහෝ ම ස්තූතියි! |
| බැංකු නිලධාරියා: | හොඳයි එහෙනම් කියවලා බලන්න. හොඳ පොලියකුත් ලැබෙනවා. |

- **ප්‍රායෝගික අභ්‍යාස (Home Work)**

### ප්‍රායෝගික අභ්‍යාස

1. එකිනෙකා සමග අදහස් හුවමාරුවේ දුර්වලතා කියැවෙන පහත සඳහන් ප්‍රස්තාව පිරුළකට අදාළ කථාවක් ලියන්න.
   - i. කළුවා මාරපත් ගියා වගේ
   - ii. හතර බීරි කතාව වගෙයි
   - iii. දොම්පෙට යන පාර ඇහුවා වාගේ
2. සවන් දීමේ දී සිත්හි තබා ගත යුතු කරුණු ඇතුළත් වගුවක් නිර්මාණය කරන්න.
3. ඔබ ඉගෙන ගන්නා දහම් පාසලේ ස්වාමීන් වහන්සේ නමක/පූජකවරයකු සමග කෙරෙන දෙබසක් ගොඩනගන්න.

## කළුවා මාරපන ගියා වගේ



එකෝමත් එක කාලෙක නිවසක කළුවා කියලා සේවකයෙක් හිටියා. මේ සේවකයාට දවසක් ස්වාමියා කිවුවා "කළුවෝ මාරපන ගිහින් වරෙන්" කියලා. කළුවා ඒක ඇසුණ ගමන් මාරපන යන්න පිටත් වුණා. ස්වාමියා මාරපන යන්න අවශ්‍ය කාරණාව කියන්න බලන කොට කළුවා ගෙදර නැහැ. හවස් වෙලා කළුවා ගෙදර ආවා.

"කොහෙද කළුවො ගියේ? ස්වාමියා කළුවාගෙන් ඇහැවුවා.

"ඇයි මට කිවුවා නේ මාරපන යන්න කියලා. ඒ නිසා මම මාරපන ගියා" කළුවා කිවුවා. ස්වාමියාටත් බිරිඳටත් දෙන්නාට ම ඒකට හිනා ගියා. කිසි ම දෙයක් සොයන්නෙ බලන්නේ නැතිව කරන වැඩ දැක්කා ම කළුවා මාරපන ගියා වගේ කියලා මිනිස්සු කියනවා.

## ගුරු අත් පොතෙන්...

- පුද්ගල විවිධත්වය කෙරෙහි අවධානය යොමු කරමින් කතා බස් කිරීමේ දී භාෂාවේ වෙනස තහවුරු කිරීමට කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යෙදෙන්න.
  - ✓ ගිහි - පැවිදි - ආගමික කටයුත්තක්,
  - ✓ ගුරු - ශිෂ්‍ය - ශිෂ්‍ය නායක දිනය,
  - ✓ මවුපිය - දූදරු - නිවසේ දෛනික කටයුත්තක්,
  - ✓ ප්‍රභූ - සාමාන්‍ය - විවෘත කිරීමේ උත්සවයක්

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10
## ඒකක පරීක්ෂණය

| 8 ශ්‍රේණිය | සිංහල භාෂාව | ඒකකය: 6 - කතාබහට අවධානය |
|---|---|---|

1) එකිනෙකා සමග අදහස් හුවමාරුවේ දුර්වලතා කියැවෙන පහත සඳහන් ප්‍රස්තාව පිරුළකට අදාළ කථාවක් ලියන්න.

(1) අබරා සිල් ගත්තා වගෙයි.
(2) දොම්පෙට යන පාර ඇහුවා වාගේ
(3) හතර බීරි කතාව වගෙයි.
(4) කළුවා මාරපන් ගියා වගේ

2) පහත දැක්වෙන අවස්ථා අලළා සුදුසු සංවාද ගොඩ නගන්න.

i) ඔබ දුම්රිය නැවතුම්පොළට ගොස් දුම්රිය ස්ථානාධිපති සමග ඇතිකර ගන්නා සංවාදයක් ගොඩ නගන්න.
ii) ඔබගේ ශ්‍රේණියේ විද්‍යා ප්‍රදර්ශනය නැරඹීමට කරන අවස්ථාවේ දී ඇතිවන සංවාදයක් ගොඩ නගන්න.
iii) ඔබ ඔබේ මව සමග මහජන පුස්තකාලයට ගියේ යැයි සිතා, ඔබට පුස්තකාල සාමාජිකත්වය ගැනීමට පුස්තකාලයාධිපති සමග ඇතිකර ගන්නා සංවාදයක් ගොඩ නගන්න.
iv) ඔබ පන්සලේ හාමුදුරුවන්ට දානයකට ආරාධනා කිරීමට පන්සලට ගියේ යැයි සිතා, එම අවස්ථාවේ ඇතිවන සංවාදයක් ගොඩ නගන්න.

3) පහත උද්ධෘත කීවේ කවුද? කාටද? අවස්ථාව සහ උපුටා ගත් කෘතිය පහත වගුවෙහි සම්පූර්ණ කරන්න.

i) ''නොයෙක් නරක වැඩ හාමුදුරුවනේ, ඔය පෙත්සම් ඔක්කොම ලියලා තියෙනවා.''
ii) ''එහෙනම් ඉස්කෝලේ ඇරිලා මාත් එක්ක කැකිරාවට යනවයි කියලා ගෙදර අයට කියලා එන්න ඕන.''
iii) ''ඔබතුමාට බොහොම ස්තුතියි.''
iv) ''මම දන්නවා වැලිගලතැන්න ක්‍රීඩා සමාජය ගැන.''
v) ''වැඩක් නං නැ මහත්තයා.''

| | උද්ධෘතය | කීවේ කවුද? | කාටද? | අවස්ථාව | උපුටා ගත් කෘතිය |
|---|---|---|---|---|---|
| i) | | | | | |
| ii) | | | | | |
| iii) | | | | | |
| iv) | | | | | |
| v) | | | | | |

සැකසුම : G.R.N. රාමවික්‍රම මිය

# පිළිතුරු



**Answer**

**1.**

## කළුවා මාරපන ගියා වගේ



එකෝමත් එක කාලෙක නිවසක කළුවා කියලා සේවකයෙක් හිටියා. මේ සේවකයාට දවසක් ස්වාමියා කිවුවා " කළුවෝ මාරපන ගිහින් වරෙන්" කියලා. කළුවා ඒක ඇසුණ ගමන් මාරපන යන්න පිටත් වුණා. ස්වාමියා මාරපන යන්න අවශ්‍ය කාරණාව කියන්න බලන කොට කළුවා ගෙදර නැහැ. හවස් වෙලා කළුවා ගෙදර ආවා.

"කොහෙද කළුවො ගියේ? ස්වාමියා කළුවාගෙන් ඇහැවුවා.

"ඇයි මට කිවුවා නේ මාරපන යන්න කියලා. ඒ නිසා මම මාරපන ගියා" කළුවා කිවුවා. ස්වාමියාටත් බිරිඳටත් දෙන්නාට ම ඒකට හිනා ගියා. කිසි ම දෙයක් සොයන්නෙ බලන්නේ නැතිව කරන වැඩ දැක්කා ම කළුවා මාරපන ගියා වගේ කියලා මිනිස්සු කියනවා.

**2.** පන්සලේ හාමුදුරුවන්ට දානයකට ආරාධනා කිරීමට පන්සලට ගියේ යැයි සිතා, එම අවස්ථාවේ ඇතිවන සංවාදයක

ස්ථානය: පූර්වාරාම විහාරය පන්සල

ඇසළ: "නායක හාමුදුරුවනේ !"

විහාරාධිපති ස්වාමීන් වහන්සේ: "ආ... උපාසක මහත්තයෝ, මොක ද මේ පැත්තේ?"

උපාසක තැන: "අවසරයි, ලොකු හාමුදුරුවනේ, අපේ ගෙදර දානයක්. අත්තා නැති වෙලා දැන් අවුරුද්දක් වෙනවනේ. ඔබවහන්සේට දානයට ආරාධනා කරන්න කියලා." (බුලත් අතක් පිළිගන්වයි.)

විහාරාධිපති
ස්වාමීන් වහන්සේ: "කවද ද තියෙන්නෙ කියමුකො බලන්න."

ඇසළ: "ලබන සතියෙ පහළොස්වෙනිදා. එදා සෙනසුරාදා දිනයක් හාමුදුරුවනේ."

(නායක හාමුදුරුවන් දිනපොත පෙරළා බලයි)

විහාරාධිපති
ස්වාමීන් වහන්සේ: "එදාට මොකුත් යෙදිලා නම් නෑ. කී නමක් ද උපාසක මහත්තයෝ?"

ඇසළ: "හත් නමක් අපේ හාමුදුරුවනේ."

විහාරාධිපති
ස්වාමීන් වහන්සේ: "හොඳයි එහෙනම් එදාට වාහනයක් එවන්න පුළුවන් නේද?"

ඇසළ: "එහෙමයි, අපේ හාමුදුරුවනේ. මට යන්ඩ අවසර."

විහාරාධිපති
ස්වාමීන් වහන්සේ: "හොඳ යි. ගොහින් එන්ඩ."

**3.**

I. "නොයෙක් නරක වැඩ හාමුදුරුවනේ, ඔය පෙත්සම් ඔක්කොම ලියලා තියෙනවා."
- ✓ ගැමි මවක්
- ✓ ඒජන්ත උන්නාන්සේට (ඒජන්තවරයා වර්තමාන ව්‍යවහාරය අනුව දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා)
- ✓ ඒජන්ත උන්නාන්සේට පෙත්සම දුන් පසු විදානෙගේ වැරදි විමසූ අවස්ථාවේ
- ✓ පෙත්සම - ලීල් ගුණසේකර

II. "එහෙනම් ඉස්කෝලේ ඇරිලා මාත් එක්ක කැකිරාවට යනවයි කියලා ගෙදර අයට කියලා එන්න ඕන."
- ✓ ගුරුවරයා, ඉස්කෝලෙ මහත්තයා
- ✓ මුදලිහාමිට
- ✓ කැකිරාවට යන්න ලෑස්ති වෙලා එන්න පුළුවන් බව මුදලිහාමි කියූ අවස්ථාවේ
- ✓ මීටර් සියය

III. "ඔබතුමාට බොහොම ස්තූතියි."

- ✓ දසුන්(ක්‍රීඩා සමාජයේ ලේකම්තුමා)
- ✓ ප්‍රාදේශීය ලේකම් තුමාට
- ✓ වැලිගලතැන්න ක්‍රීඩා සමාජයේ ත්‍යාග හා සහතික පත්‍ර බෙදා දීමේ උත්සවයට ආ හැකි බව ප්‍රාදේශීය ලේකම්තුමා ප්‍රකාශ කළ අවස්ථාවේ
- ✓ -

IV. "මම දන්නවා වැලිගලතැන්න ක්‍රීඩා සමාජය ගැන."

- ✓ ප්‍රාදේශීය ලේකම් තුමා
- ✓ දසුන්ට (ක්‍රීඩා සමාජයේ ලේකම්තුමාට)
- ✓ වැලිගලතැන්න ක්‍රීඩා සමාජයේ ත්‍යාග හා සහතික පත්‍ර බෙදා දීමේ උත්සවයට ප්‍රාදේශීය ලේකම්වරයාට ආරාධනා කිරීම සඳහා ආරාධනා පත්‍රය පිළිගැන්වූ අවස්ථාවේ
- ✓ -

V. "වැඩක් නං නෑ මහත්තයා."

- ✓ මුදලිහාමි
- ✓ ගුරුවරයාට, ඉස්කෝලෙ මහත්තයාට
- ✓ "හෙට සවස ගෙදර වැඩක් මොකුත් තියෙනවා දැ?" යි ගුරුවරයා මුදලිහාමිගෙන් විමසූ අවස්ථාවේ
- ✓ මීටර් සියය



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප **3in1 Youtube** නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



**3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

**Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1**

**එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ**